ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2019-01-09 |

**සංචිත ඉහළ නැංවීම සඳහා විනිමය හුවමාරු පහසුකම යටතේ ඉන්දීය සංචිත බැංකුවෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 400ක්**

දකුණු ආසියාතික කලාපීය සහයෝගීතා සංවිධානයේ (සාර්ක්) සාමාජික රටවල් අතර පවත්නා විනිමය හුවමාරු පහසුකම යටතේ එක්සත් ජනපද ඩොලර් මිලියන 400ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දීමට ඉන්දීය සංචිත බැංකුව එකඟ වී ඇත.

මීට අමතර ව, එක්සත් ජනපද ඩොලර් බිලියනයක් ලබා ගැනීම සඳහා ඉන්දීය සංචිත බැංකුව සමග ද්විපාර්ශ්වික ගිවිසුමකට එළඹීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් කරන ලද ඉල්ලීම ද සලකා බැලෙමින් පවතී.

ආනයන සහ ණය සේවාකරණය සම්බන්ධ මුදල් ගෙවීම් සිදුකරමින්, අවිධිමත් ගැලපීම් වලක්වා අවශ්‍ය විටෙක දී ව්‍යවහාර මුදල් තත්ත්වය මනාව පවත්වා ගැනීමෙන් ද, විදේශ සංචිත ප්‍රමාණවත් පරිදි පවත්වා ගැනීමෙන් ද ආයෝජක විශ්වාසය ඉහළ නැංවීමෙහි ලා ඉන්දීය සංචිත බැංකුවෙන් ලැබුණු කඩිනම් සහයෝගය මහෝපකාරී වනු ඇත.

මෙම එකඟතාවට එළඹීමේ දී ඉන්දීය මධ්‍ය රජයත්, නව දිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයත්, කොළඹ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයත් දැක්වූ ක්‍රියාශීලී සහයෝගය ශ්‍රී ලංකා මහ බැංකුව අගය කරයි.

රටේ පැවති දේශපාලන වෙනස්වීම් නිසා ඇති වූ ප්‍රමාදයන් අවසන් වීමත් සමග ශ්‍රී ලංකා රජයත් ශ්‍රී ලංකා මහ බැංකුවත් විසින් පහත සඳහන් ක්‍රියාවලීන් පිළිබඳ ව විමර්ශනය කෙරෙමින් පවතී.

(i) ජාත්‍යන්තර සෛවරීත්ව බැඳුම්කර නිකුත් කිරීම

(ii) කාලීන ණය ලබා ගැනීම

(iii) රාජ්‍ය බැංකු හරහා ණය ලබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සාකච්ඡා කිරීම

මෙම කටයුතු 2019 වසරේ පළමු කාර්තුවේ දී නිමා වීමට නියමිත ය.

එසේ ම, විස්තීර්ණ අරමුදල් පහසුකම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා කෙරෙන සාකච්ඡා නැවත ආරම්භ කිරීම සඳහා ගරු මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර මහතා වොෂින්ටන්හි සංචාරයක නිරත වීමට නියමිත ය.